**පළාත් මාර්ග ව්‍යාපෘතිය - ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකයේ (ව්‍යා.ස.ඒ.) - 2014**

-----------------------------------------------------------------------------------------------

පළාත් මාර්ග ව්‍යාපෘතිය - ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකයේ (ව්‍යා.ස.ඒ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී.ලං.ර) සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජා.සං.සං) අතර 2010 ජනවාරි 11 දින එළඹි අංක 4630 එල්කේ් දරන ණය ගිවිසුමේ 4.09(ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

-----------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය වර්තමානයේ, පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ඌව, නැගෙනහිර හා උතුරු පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ වැඩිදියුණු කළ මාර්ග යටිතල පහසුකම් පිළිබඳ තිරසාර කළමනාකරණය මගින් ප්‍රතිගාහක ඌව, නැගෙනහිර හා උතුරු පළාත්වල සමාජ, ආර්ථික මධ්‍යස්ථාන සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීමයි. ව්‍යාපෘති ශක්‍යතා ලියවිල්ල ප්‍රකාරව, ව්‍යාපෘතියේ - ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකයේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 475 කට සමාන එ.ජ.ඩො. මිලියන 3.8 ක් වන අතර, ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජා.සං.සං) විසින් සම්පූර්ණ මුදලම මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 මාර්තු 31 දින ආරම්භ කරන ලද අතර, 2015 මාර්තු 31 දින වන විට නිම කිරීමට නියමිතය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

----------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමත් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

-------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පිරිපාටි වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් වලදී විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිතබව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍යයැයි සලකණු ලැබූ පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව,

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා ඇති වියදම්, ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන මූල්‍ය වාර්තා හා කාර්යසාධන වාර්තා සමඟ ප්‍රමාණවත් පරිදි සැසඳීම්කර තිබේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව,

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව,

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව,

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව,

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව,

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ග ගෙන තිබූ බව සහ,

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

#### 2.2.1 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

---------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 371 (අ) අනුව, අපේක්ෂිත අරමුණු සම්පූර්ණ වූ වහාම ලබා ගන්නා ලද අත්තිකාරම් අදාල නිලධාරීන් විසින් පියවිය යුතුය. නමුත් අවස්ථා 12 කදී නිලධාරීන් තිදෙනෙකු විසින් ලබා ගන්නා ලද එකතුව රු.521,800 ක අත්තිකාරම් මුදල් පියවීම දින 25 සිට දින 275 ක් දක්වා ප්‍රමාද කර තිබුණි.

(ආ) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2010 ඔක්තෝබර් 10 දිනැති අංක MOFP/01/2010/01 දරන චක්‍රලේඛය අනුව දිනකට ගෙවිය හැකි අනියම් දීමනාව ඇ.ඩො. 30 ක් වුවද ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 04 කදී විදේශ පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වූ නිලධාරීන් 9 දෙනෙකු සඳහා එක් නිලධාරියෙකු වෙනුවෙන් දිනකට ඇ.ඩො. 50 බැගින් වූ අනියම් දීමනා ගෙවා තිබුණි. ඒ අනුව රු.140,476 ක මුදලක් චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව ගෙවා තිබුණි.

(ඇ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන චක්‍රලේඛයේ 8.1 ඡේදයේ විධිවිධාන අනුව ව්‍යාපෘති නිලධාරීන්ට තම ව්‍යාපෘති සේවා කාලය තුළ එක් කෙටිකාලීන විදේශ පුහුණු සංචාරයක් සඳහා පමණක් සහභාගී වීමට අනුමැතිය ඇත. නමුත් ව්‍යාපෘතියේ නිලධාරීන් 10 දෙනෙකු ව්‍යාපෘති සේවා කාලය තුළ අවස්ථා කිහිපයකදී විදේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වී ඒ සඳහා රු.14,975,017 ක මුදලක් වියදම්කර තිබුණි.

(ඈ) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2012 ජූලි 09 දිනැති අංක CA/P/P/A/1/1/16/1 දරන චක්‍රලේඛය අනුව විදේශ සංචාරයකින් පසු දිවයිනට පැමිණ දින 07 ක් ඇතුළත වාර්තා ඉදිරිපත් කළ යුතු නමුත්, ව්‍යාපෘති ආරම්භක අවස්ථාවේ සිට රු.22,752,896 ක ව්‍යාපෘති මුදල් යොදා ගනිමින් විදේශ සංචාරයන්ට සහභාගි වූ නිලධාරීන් 37 දෙනෙකු 2014 දෙසැම්බර් 31 දින විටත් අදාල වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

සමාලෝචිත වර්ෂය සඳහා අරමුදල් ප්‍රභවයන්, අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය සඳහා හා 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛණ පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යනය කිරීම සඳහා එකඟ වූ මුදල | | අයවැය ඇස්තමේන්තු අනුව 2014 වර්ෂය සඳහා වෙන්කළ අරමුදල් | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2014 වර්ෂය සඳහා | | 2014 දෙසැම්බර් 31දින දක්වා | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ජා.සං.සං | 3.8 | 475 | 80 | 0.54 | 71.1 | 2.4 | 300.9 |
| එකතුව | 3.8 | 475 | 80 | 0.54 | 71.1 | 2.4 | 300.9 |

**3.2 භෞතික කාර්යසාධනය**

---------------------------

ණය නියෝජිතායතනය හා ව්‍යාපෘතියේ වෙනත් සංරචකයන් ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ වෙනත් පළාත් 03 ක නිලධාරීන් අතර සම්බන්ධීකරණය කිරීම ව්‍යාපෘති සම්බන්ධිකරණ ඒකකයේ වගකීම වේ. ඊට අමතරව, උපදේශණ සහ තාක්ෂණික සහය සහ අයිතමයන්ට අදාල ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමද ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය සිදුකරණු ලබයි. නමුත් ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණි.

**3.3 ව්‍යාපෘති පරිපාලනය**

-----------------------

ඇස්පෝල්ට් පරීක්ෂණ උපකරණ ප්‍රසම්පාදනයේදී ලද ලංසු 06 ක් අතුරින් අවම ලංසුව වන රු.6,729,184 ප්‍රතික්ෂේප කිරීමට වලංගු හේතුවක් නොමැතිව දෙවන ලංසුව වන රු.8,625,432 තෝරාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. තවද පාංශු පරීක්ෂණ උපකරණ ප්‍රසම්පාදයේදී ලද ලංසු 07 ක් අතුරින් අවම ලංසුව වන රු.12,266,257 ප්‍රතික්ෂේප කිරීමට වලංගු හේතුවක් නොමැතිව තෙවන අවම ලංසුව වන රු.12,392,800 ඉදිරිපත් කළ ඉහත ලංසුකරුම තෝරාගෙන තිබුණි.

**3.4 ඌන උපයෝජිත සම්පත්**

-----------------------------

2014 ජනවාරි සිට මාසික කුලිය රු.140,400 කට වාරිකා නිවාසයක් හුලංදුව - කහම්බාන මාර්ගයේ පුනරුත්ථාපන කටයුතු සිදුකළ කොන්ත්‍රාත්කරු හරහා ව්‍යාපෘතිය විසින් කුලියට ලබාගෙන තිබුණි. නමුත් බදුල්ල ප්‍රදේශයේ අධීක්ෂණ කටයුතු සඳහා පැමිණි නිලධාරීන් ව්‍යාපෘතිය විසින් සපයන ලද මෙම පහසුකම භාවිතා නොකර වෙනත් ස්ථානවල ලැගුම්ගෙන වියදම් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි.

**3.5 අරමුණට පටහැනි ක්‍රියාකාරකම්**

-------------------------------------

ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට සෘජුවම අදාල නොවන වීඩියෝ පිටපත් නිර්මාණය හා දැයට කිරුළ ප්‍රදර්ශණය සඳහා සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු.300,000 හා රු.267,333 ක් වියදම් දරා තිබූ බව නිරීක්ෂණය විය.